සැ. යු.- 2011.09.30 දින පළ වූ අංක 1,726 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,727 - 2011 ඔක්තෝබර් මස 07 වැනි සිකුරාදා - 2011.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1522 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1523 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1524 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1528 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ඔක්තෝබර් මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 සැප්තැම්බර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1521- B 080365—8,950 (2011/10)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිළ ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2012***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමට මිළ ගණන් 2011 නොවැම්බර් මස 03 දින පස්වරු 2.00 දක්වා අදාල පළාත් සර්වේයර් ජනරාල් කාර්යලවලදී භාරගනු ලැබේ. ඒ සඳහා වන විස්තර සහ ඉල්ලුම්පත්‍ර කාර්යාල වේලාවන් තුළ අදාල පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250.00 (රුපියල් දෙසීය පනහක) මුදලක් ගෙවා 2011 නොවැම්බර් මස 03 වැනි දින මධ්‍යහන 12.00 තෙක් ලබාගත හැක.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *අයදුම්පත් හා අනෙකුත් විස්තර ලබාගත හැකි ස්ථාන* | *මිළ ගණන් භාරගැනීම* |
|---|---|---|---|---|
| උතුරුමැද | පොලොන්නරුව | හිඟුරක්ගොඩ | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (උතුර මැද පළාත)/දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, පොලොන්නරුව | පලාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (උතුරු මැද පළාත) අනුරාධපුරය |

කවරයේ ඉහල වම් කෙළවරෙහි "ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම" (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කරන ලද මිළ ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තර ද සහිතව 2011 නොවැම්බර් මස  දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්,
කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී.

10-91

---

යොමු අංකය :SRS/F.6894

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**රාත්තල් 88 රේල් සෙක්ෂන් කොන්ක්‍රීට් සිල්පර සඳහා රබර් පෑඩ් 100,000 ක් ප්‍රසම්පාදනය**

1. රාත්තල් 88 රේල් සෙක්ෂන් කොන්ක්‍රීට් සිල්පර සඳහා රබර් පෑඩ් 100,000 ක් මිලදී ගැනීම සඳහා කොළඹ 10, ඕල්කොට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, නිෂ්පාදකයින් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. ලංසු භාරගැනීම 2011.10.12 වන දින පස්වරු 2.00 ට අවසන් කෙරේ.

3. ආපසු ගෙවනු නොලබන ලිපිලේඛන ගාස්තු රුපියල් 2,500.00 ගෙවීමෙන්, 2011.10.10 දින පස්වරු 3.00 දක්වා කොළඹ 10, ඕල්කෝට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතුවේ.

4. 2011.10.12 වන දින පස්වරු 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලබන අතර, ඒ හා සමගම, කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, සාමාන්‍යාධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු කරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

5. මුද්‍රා තැබූ ලංසු ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත, කොළඹ 10. යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

6. කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ලංසු ලිපිලේඛන නොමිලයේ පරීක්ෂාකොට බැලිය හැකි අතර, වැඩිදුර විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, ඕල්කොට් මාවත, කොළඹ 10 යන අය. දුරකථන අංක 2432044 හෝ 2436818 එයින් ඇමතිය හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

10-30

# බඩු බාහිරාදිය විකිණීම්

**මහාධිකරණය - හම්බන්තොට**

මහාධිකරණ විනිසුරු නිල නිවස ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු ඉතිරිව ඇති අබලි ද්‍රව්‍ය හා 2010.12.31 දිනැති වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අදාල භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හම්බන්තොට මහාධිකරණ විනිසුරු නිල නිවස ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු ඉතිරිව ඇති අබලි ද්‍රව්‍ය හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරිදි වෙන්දේසි කළ යුතු භාණ්ඩ වර්ෂ 2011.10.21 වැනි දින පෙ.ව. 9.00 ට මහාධිකරණ විනිසුරු නිල නිවස භූමියේදී හා මහාධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදීම මුදල් ගෙවිය යුතු අතර සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. චෙක්පත් හෝ මුදල් ඇනවුම් භාර ගනු නොලැබේ.

03. තක්සේරු මණ්ඩලය විසින් නියම කරන ලද අවම ලන්සුව නොපිලි ගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය අනුව එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් භාණ්ඩ මිළදී ගන්නා අය තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු අතර මිලදී ගන්නා භාණ්ඩ සියල්ල නිල නිවස භූමියෙන් හා අධිකරණ භූමියෙන් ප.ව. 4.00 ට පෙර ඉවත් කර ගත යුතුය.

ඊ. ඩබ්. එම්. එල්. ඒකනායක,
මහාධිකරණ විනිසුරු,
හම්බන්තොට.

2011 සැප්තැම්බර් 14 වැනි දින,
හම්බන්තොට මහාධිකරණයේ දී ය.

**භාණ්ඩ වෙන්දේසිය**

*2011.10.21 දින හම්බන්තොට මහාධිකරණයේ දී ය.*

| *අනු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* | |
|---|---|---|
| 01. | 1 පැන් ස්විච් | 04 |
| 02. | 3 පැන් ස්විච් | 04 |
| 03. | 2 පැන් ස්විච් | 03 |
| 04. | 5 පැන් ස්විච් | 01 |
| 05. | 15Am ප්ලග් | 01 |
| 06. | 5 Am ප්ලග් | 04 |
| 07. | ප්ලාස්ටික් පෙට්ටි | 17 |
| 08. | බිත්ති ලාම්පු | 02 |
| 09. | ඇන්ගල් හෝල්ඩර් | 01 |
| 10. | රවුම් බ්ලොක්ක | 19 |
| 11. | සිවිලින් රෝස් | 09 කැලි 04 |
| 12. | සී.ජී. හෝල්ඩර්ස් | 07 |
| 13. | ප්ලාස්ටික් එල්ලන ලාම්පු | 04 (හෝල්ඩර්ස් සමඟ) |
| 14. | ප්ලාස්ටික් එල්ලන ලාම්පු | 02 |
| 15. | ටූ නෝර් වයර් කෑලි | 15 |
| 16. | විදුලි මීටර් ලෑලි පෙට්ටි | 01 |
| 17. | ට්‍රිප් ස්විච් | 01 |
| 18. | මේන් ස්විච් | 01 |
| 19. | පියුස් පෙට්ටි | 01 |
| 20. | බෙල් | 01 |
| 21. | රෙගියුලේටර් | 05 |
| 22. | සිවිලින් පැන් | 06 |
| 23. | බල්බ් | 04 |
| 24. | 1/044 වයර් කෑලි | 81 |
| 25. | අර්ත් වයර් කෑලි | 13 |
| 26. | Telephone වයර් කෑලි | 02 |
| 27. | මේන් වයර් කෑලි | 01 |
| 28. | කොමොඩ් | 02 |
| 29. | සිස්ටන් | 02 |
| 30. | සෝදන බේසම් | 02 01 ක් කැඩී ඇත |
| 31. | සබන් රඳවන | 02 |
| 32. | ඇඳුම් එල්ලන | 02 |
| 33. | ෂවර් | 02 |
| 34. | වොෂ් බේසින් ටැප් | 01 |
| 35. | සින්ක් ටැප් | 01 |
| 36. | 1/2 ටැප් | 01 |
| 37. | ස්ටොප් වැල් | 02 |
| 38. | ප්ලාස්ටික් ෂවර් | 01 |
| 39. | 1/2 PVC බට කෑලි 10 (2" පමණ කෑලි) | |
| 40. | පිත්තල සරනේරු කෑලි | |
| 41. | පිත්තල සොයිබ කෑලි | |
| 42. | ජූනියර් ලොක් කෑලි | |
| 43. | රට උළු | 771 |
| 44. | මුදුන් උළු | 53 |
| 45. | 1" ලෑලි දිග ගොඩවල් | 01 |
| 46. | 1" ලෑලි කොට ගොඩවල් | 02 |
| 50. | 2 x 1 රීප්ප ගොඩවල් | 02 |
| 51. | 2 x 1 රීප්ප කොට ගොඩවල් | 01 |
| 47. | 2" x 4" දැව ගොඩවල් | 01 |
| 49. | ලී ගොඩවල් | 02 |
| 52. | යටලී ගොඩවල් | 01 |
| 53. | 2" x 4" උළුවස්ස | 01 |
| 54. | පලු දෙකේ ග්‍රිල් හා පියන් සමග ජනෙල් රාමු | 02 |
| 55. | පලු දෙකේ යකඩ කූරු හා පියන් සමග ජනෙල් රාමු | 01 |
| 56. | කන්නාඩි මේස (කන්නාඩි රහිත) | 01 |
| 57. | පුටු සාමාන්‍ය (අබලන්) | 06 |
| 58. | පුටු ඇඳි සහිත (අබලන්) | 09 |
| 59. | පාපැදි (ලුමාලා) (අබලන්) | 01 |

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

අංක 243/1, උඩමුල්ල, මුල්ලේරියාව නව නගරය, යන ස්ථානයේ පදිංචිව සිටින සුනීතා කුරේ වන මම අංක 243/1, උඩුමුල්ල, මුල්ලේරියාව නව නගරයේ පදිංචිව සිටින විජේතුංග ලොකු පිටුම්පගේ දෝන ගර්ලි සුදර්ශනී යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරමින් සකස් කර ඇති ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. සිරිසේන විසින් සහතික කරන ලද අංක 447 හා 2007.07.21 වෙනි දින දරන ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ට කරන බවත් මින් පසු එකී ඇටෝර්නි බලපත්‍රය මත කෙරෙන මොනම ආකාරයක හෝ ක්‍රියාවකින් මා බැඳී නොසිටින බවත් ශ්‍රී ලංකා ජනරජයට සහ සියලුම ජනතාවට දැනුම් දෙමි.

සුනීතා කුරේ.

2011 අගෝස්තු මස 15 වැනි දින,
අංක 243/1, උඩුමුල්ල, මුල්ලේරියාව නව නගරය.

10-92

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

කොළඹ 08, ග්‍රෙනියර් පාර, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි නිමලා ලියනපටබැඳි (විදේශ ගමන් බලපත්‍ර අංක LKAL 0862639) වන මා විසින් කොළඹ 08, ග්‍රෙනියර් පාර, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි චන්ද්‍රන ලියනපටබැඳි (ජාතික හැඳුනුම්පත් අංක 640483350 V) යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් එච්. චන්ද්‍රකුමාර් ද සිල්වා මහතා විසින් ලියා සහතික කරන ලද අංක 147 සහ 1999 අගෝස්තු 13 දින දරන, ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2011 ක් වූ සැප්තැම්බර් මස 15 වන දින පටන් අවලංගු කර, ප්‍රත්‍යාදිෂ්ඨ කර, අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් දැනුම් දෙන අතර වර්ෂ 2011 සැප්තැම්බර් මස 15 වන දින සිට එකී චන්ද්‍රන ලියනපටබැඳි යන අය මා වෙනුවෙන් ඇතුලත් වන කිසිදු ගිවිසුමක් වෙනුවෙන් මා කිසිදු වගකීමක් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

නිමලා ලියනපටබැඳි.

වර්ෂ 2011 ක්වූ සැප්තැම්බර් මස 15 වැනි දින දී ය.
අංක 12, ග්‍රෙනියර් පාර, කොළඹ 08.

10-26

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්ති ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඉන්ටනැෂනල් මිනරල් රිසෝසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV81102
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2011 සැප්තැම්බර් 11

කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

10-115

## සංස්ථාපිත දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9(1) වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නාමය : කළුතර ලක්ෂරි හොටෙල් ඇන්ඩ් රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : PV 80869
සංස්ථාපිත දිනය : 2011 අගෝස්තු 24
සමාගමේ ලියාපදිංචි ලිපිනය : 36, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කළුතර ලක්ෂරි හොටෙල් ඇන්ඩ් රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
හේමාස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

10-37/2

---

## මහජනයා වෙත දැනුම් දීමයි

සමනල පේපර් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සීමිත සමාගම හා සමනල ප්‍රොපටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සීමිත සමාගම ඒකාබද්ධ කිරීම

ඉහත කී සමාගම් දෙක සමනල පේපර් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සීමිත සමාගම යන නාමය, යටතේ, 2011 වසරේ ඔක්තෝබර් 1 වැනි දින සිට බල පැවැත්වන පරිදි ඒකාබද්ධ කරණු ලබන බව දැනුම් දෙමි. මෙම ඒකාබද්ධ කිරීමට අනුව සමනල ප්‍රොපටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සීමිත සමාගම විසුරුවා හරිනු ලැබේ. මෙම ඒකාබද්ධ කිරීමට අදාල යෝජනාවලිය මීගමුවේ, බෝල්වලානේ, ශ්‍රී වික්‍රම රාජසිංහ පාරේ, අංක 23 ස්ථානයේ දී පරීක්ෂා කල හැක. මෙම දැන්වීම වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 247(4) (I) ඡේදයට අනුකූලව පලකරන ලදී.

ලේකම්වරු.

කොම්සෙකී (පුද්ගලික) සීමිත සමාගම,
2011 සැප්තැම්බර් මස 5 වැනි දා.

10-107

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : ඇග්‍රොවෙට් ඇනිමල් හෙල්ත් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 80455
සංස්ථාගත කළ දිනය : 2011.08.03
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : අංක 105, සණස අයිඩියල්, කොළඹ පාර, ගම්පහ.

ලේකම්වරු.

10-108/1

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : එල් එන් පේපර් කන්වර්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 80431
සංස්ථාගත කළ දිනය : 2011.08.12
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : අංක 18, නාවල පාර, නුගේගොඩ.

ලේකම්වරු.

10-108/2

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : කේ ජී කොන්සොලිඩේටිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 80430
සංස්ථාගත කළ දිනය : 2011.08.03
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : අංක 66, කැළණි ගඟ මිල් රෝඩ්, කොළඹ 15.

ලේකම්වරු.

10-108/3

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ සියළු දෙනාගේම දැන ගැනීම පිණිස මෙසේ දැනුම් දෙනු ලැබේ. ගාල්ල, කරාපිටිය, පළමුවන පටුමග, සනිසයිඩ් ගාර්ඩ්න්ස්, අංක 32/247 දරන ස්ථානයේ පදිංචි අමුගොඩ කංකානම්ගේ බර්ට් ලයනල් ජයසේකර වන මා විසින් උණවටුන තල්පේ උතුර, විදානගේ වත්ත පදිංචි වෙල්ගමගේ අනුරාධ යන අය වෙත බලය පවරමින් ලියාපදිංචි කර ඇති ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් වත්සලා පින්නදූවහේවා මහත්මිය විසින් ලියා සහතික කළ අංක 221 සහ වර්ෂ 2009.10.16 දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ශූන්‍ය කර බල රහිත කර සිටිමි. මෙතැන් සිට එකී වෙල්ගමගේ අනුරාධ යන අය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුළත් වනු ලබන කිසිම ගිවිසුමක් සම්බන්ධයෙන් මා වග කියනු නොලබන බව ද මෙයින් දැනුම් දෙමි.

10-112

---

### සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය

සමාගමේ නම : සිවීටා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV81287
සංස්ථාගත කළ දිනය : 2011.09.15
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 87, දෙවන මහල, පුත්තලම් පාර, හලාවත.

සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට්
සර්විසස් (පෞද්ගලික)
ලේකම්වරු.

අංක 96 -2/2, මල්වත්ත පාර, කොළඹ 11
2011 සැප්තැම්බර් මස 21 වැනි දින.

10-116

---

### සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය

සමාගමේ නම : ඒටීසී ප්‍රොෆෙෂනල් කුරියර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පි වී 80531
සංස්ථාගත කළ දිනය : 2011.08.17
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 10/1, අත්තිඩිය පාර, කවුඩාන, දෙහිවල.

සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට්
සර්විසස් (පෞද්ගලික)
ලේකම්වරු.

අංක 96-2/2, මල්වත්ත පාර,
කොළඹ 11.
2011 සැප්තැම්බර් මස 01 වැනි දින.

10-117

---

### සංස්ථාපිත දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9(1) වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීමයි

සමාගමේ නාමය : රාවනාකන්ද හයිඩ්‍රෝ පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : PV80952
සංස්ථාපිත දිනය : 2011 අගෝස්තු 29
සමාගමේ ලියාපදිංචි ලිපිනය : 36, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රාවනාකන්ද හයිඩ්‍රෝ පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්,
හේමාස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ලේකම්වරු.

10-37/1

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඩිවින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 80932
ලියාපදිංචි දිනය : 2011.08.26
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 35, කටුවාන පාර, හෝමාගම

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්) සමාගම,
සමාගම් ලේකම්වරු.

10-28

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

සිංගප්පූරුව 189702, ෂෝ ටවර්ස් අංක 26-01 (පෙර 31-01) දරන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය අංක 100 පිහිටා ඇති ටෝප්ෆර් ඉන්ටනැෂනල් ඒෂියා ප්‍රයිවට් ලිමිටඩ් වන අප විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා පොදු ජනතාවට නිවේදනය කරන වග නම්, 2005 සැප්තැම්බර් 26 දින සිංගප්පූරුවේ ප්‍රසිද්ධ නොතාරිස් විල්සන් යිප් විසින් සහතික කොට ශ්‍රී ලංකා ජනරජයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ බලධාරීන්ගේ ලිඛිත නිල ලේඛනයේ 312 වෙළුමේ පිටු අංක 176 හි ලියාපදිංචි කරන ලද දවසේ ගණන් පොතේ 15258 යොමුවේ ලියාපදිංචි කරන ලද ශ්‍රී ලංකා ජනරජයේ, කොළඹ 08 කාර්ල්ෂු උද්‍යානයේ, ජාතික හැඳුනුම්පත් අංක 565650777V හිමි ඉරෝමි දර්ශිනි විජේසේකර වෙත නිකුත් කරන ලද ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලදී.

ටොප්ෆර් ඉන්ටනැෂනල් - ඒෂියා ප්‍රයිවෙට් ලිමිටඩ්.

2011 සැප්තැම්බර් මස 06 වැනි දින.

10-27

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඩිරෙක්ට් එෆ් එන් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගම් අංකය : PV81166
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : පළමු මහල, අංක 106, දුටුගැමුණු වීදිය, දෙහිවල.
ලියාපදිංචි කල දිනය : 2011 සැප්තැම්බර් 08

කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

10-31

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

මෙහි පහත සඳහන් ඇටර්නි බලපත්‍රයන්හි ඇටර්නි අධිපති වන රත්මලාන, මල්ලිකාරාම පාර, අංක 58 හි පදිංචි දැන් වත්තල, මීගමුව පාර, මහින්ද මල් ශාලාව අංක 288 හි පද්මා ජයසිරි බණ්ඩාර වන මා විසින් මාගේ ඇටර්නි බලකාරිය වශයෙන් පත් කර දෙනුලැබූ ඇටර්නි බලපත්‍ර වර්ෂ 2011 ක් වූ ජූලි මස 28 දින සිට අවලංගු කරනු ලැබේ. ප්‍ර. නො. ආර්. සී. ද සොයිසා විසින් ලියා සහතික කළ අංක 2264 හා 2010.02.02 දින දරන ඇටර්නි බලපත්‍රය සහ අංක 2043 සහ 2008.07.09 දින දරන ඇටර්නි බලපත්‍රය.

10-25

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනත යටතේ 9 වගන්ති ප්‍රකාරව පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලද බව දන්වා සිටිමි.

සමාගමේ නම : ජියෝඇසෙට් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 80993
ලියාපදිංචි ලිපිනය : අංක 04, ජයන්තිපුර පාර, බත්තරමුල්ල
ලියාපදිංචි දිනය : 2011 සැප්තැම්බර් මස 01.

සමාගමේ ලේකම්.

10-201

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අක්මීමන, ගනේගොඩ පදිංචිව සිට දැනට කොළඹ පිටකෝට්ටේ, පාගොඩ පාරේ අංක 139/8ඒ හි පදිංචි බෝඩීෂියා ශීලා ජයගොඩ විවාහයට පෙර ලොකුමාලගේ බෝඩීෂියා ශීලා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාව වෙතත් මෙයින් දන්වා සිටින්නේ, මාගේ වර්ෂ 1997 ඔක්තෝබර් මස 18 වැනි දින ගාල්ලේ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් විජිතා මාලනී ඩයස් ජයසේකර මහත්මිය විසින් සහතික කළ අංක 223 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ඉවත්කර ගන්නා බවත්, ඒ අනුව එකී බලපත්‍රය මගින් බලය පවරන ලද අක්මීමන, ගනේගොඩ ඩිස්පෙන්සරි වත්තතේ පදිංචි නෙල්සන් ලොකුමාලගේ නොහොත් ලොකුමාලගේ නෙල්සන් යන අය විසින් මා වෙනුවෙන් සහ මාගේ නමින් මින් පසු සිදු කරනු ලබන සියලුම ක්‍රියාවන් සම්බන්ධයෙන් මා කිසිදු වගකීමක් නොදරන බවත් එවැනි ක්‍රියාවන් වෙත්නම් එකී ක්‍රියාවන් මාගේ ක්‍රියාවන් නොවන බවත් ය.

බෝඩීෂියා ශීලා ජයගොඩ හෙවත්
ලොකුමාලගේ බෝඩීෂියා ශීලා.

10-204

---

## ඇටෝර්නි බලපත්‍රයෙන් මා දුන් බලය අවලංගු කිරීම

බණ්ඩාරගම, රඹුක්කන අංක 86 හි පදිංචි රඹුක්කන පලිහවඩනගේ හිරන්ත ප්‍රසාද් වන මම මාගේ ඇටර්නි බලකරු ලෙස බණ්ඩාරගම, රඹුක්කන අංක 53 හි පදිංචි උඩුවගේ කසුන් ධනුෂ්ක පෙරේරා යන අය පත් කරමින් ගාමිණී ඒකනායක ප්‍රසිද්ධ නොතාරිස් තැන 2004.08.16 වැනි දින සහතික කළ අංක 483 දරන සහ විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් මා විසින් දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. එය මත මින් ඉදිරියට මා වෙනුවෙන් ඔහු විසින් කරන ලද කිසිදු කටයුත්තකට මම වග නොකියන බව ප්‍රකාශ කරමි.

රඹුක්කන පලිහවඩනගේ හිරන්ත ප්‍රසාද්.

අංක 86,
රඹුක්කන, බණ්ඩාරගම.

10-197

**පවුල් සහන සේවා මධ්‍යස්ථානය**

සමාගම් ලියාපදිංචි අංකය ජී ඒ 337

2011 සැප්තැම්බර් මස 05 වැනි දින ආයතනයේ පැවති විශේෂ මහා සභා රැස්වීමේ සම්මත වූ විශෙෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 320(1) වගන්තිය යටතේ මෙම ආයතනය 2011 සැප්තැම්බර් මස 05 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

නිර්මලී ගුණතිලක,
විජිත ප්‍රනාන්දු,
මනෝරි මුට්ටෙට්ටුවේගම,
මනීෂා වික්‍රමනායක,
හෙන්රි ඩී මෙල්,
අරුනාසලම් ස්කන්දරාජ්,
ලෝගනාතන් විජයනාතන්.

අධ්‍යක්ෂකවරුන්.

2011 සැප්තැම්බර් මස 05 වැනි දින.

10-135/1

**පවුල් සහන සේවා මධ්‍යස්ථානය**

සමාගමේ ඇවරකරුවන් පත්කිරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 346(1) වගන්තිය

***සමාගම් ලියාපදිංචි අංකය : ජීඒ 337***

කොළඹ 04, කාසල් පටුමගේ අංක 02 හි හතරවන මහලෙහි පදිංචි පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ් යන අප කුරුණෑගල, ගැට්ටුවාන පාර, අංක 259 සී දරන ස්ථානයේ පිහිටි පවුල් සහන සේවා මධ්‍යස්ථාන ආයතනයේ ඇවරකරුවන් ලෙස කොළඹ 04, කාසල් පටුමගේ අංක 02 හි හතරවන මහලෙහි 2011 සැප්තැම්බර් මස 05 වැනි දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ සාමාන්‍ය යෝජනා සම්මතයෙන් එම ආයතනයේ ඇවරකරුවන් වශයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්, ඇවරකරුවන්.
පවුල් සහන සේවා මධ්‍යස්ථානය.

එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත හා ආයතනික අයකර ගැනීම්,
හතරවන මහල, අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04.
2011 සැප්තැම්බර් මස 14 වැනි දින.

10-135/2

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතන සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඩිජිටල් මීඩියා නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 78604
ලියාපදිංචි දිනය : 2011.05.02
ලියාපදිංචි ලිපිනය : අංක 03 ඒ, පාර්ක් ටෙරස්, දෙහිවල.

සමාගමේ නම : ජී. එල්. එස්. එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 79016
ලියාපදිංචි දිනය : 2011.05.25
ලියාපදිංචි ලිපිනය : අංක 329/80, ලේක් ක්‍රෙසන්ට්, අත්තිඩිය, දෙහිවල.

සමාගමේ නම : ඇවෙන්චුරා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 79681
ලියාපදිංචි දිනය : 2011.06.28
ලියාපදිංචි ලිපිනය : අංක 421, ඇල්විටිගල මාවත, කොළඹ 5.

සමාගමේ නම : බිස්නස් ඩිවලොප්මන්ට් කස්සෙප්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 79684
ලියාපදිංචි දිනය : 2011.06.28
ලියාපදිංචි ලිපිනය : අංක 7/1, හෝටල් පාර, ගල්කිස්ස.

සමාගමේ නම : කාල්ටන් ස්පෝර්ට්ස් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 80750
ලියාපදිංචි දිනය : 2011.08.18
ලියාපදිංචි ලිපිනය : අංක 90, දෙවැනි හරස් වීදිය, බොරුපන පාර, රත්මලාන.

ඩබ්. එස්. වීරමන්,
ලේකම්.

අංක 27/1, පැපිලියාන පාර,
නැදිමාල, දෙහිවල.

10-193

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මහනුවර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර මහ නගර සභා සීමාවන් තුළ පේරාදෙනිය පාර දැනට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත හි පිහිටි ඉඩමට බලයලත් මානක සී. ඒ. ඕ. ඩිර්ක්ස් විසින් මැන සාදන ලද 1986.09.15 වැනි දින අංක 1373 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස හා එහි තුළ පිහිටි වරිපනම් අංක 231 දරන ගොඩනැගිල්ල ඇතුළු සියළු දේ. ඉඩමේ ප්‍රමාණය (පර්චස් 4.45)

*දේපලට පිවිසීම.*- මහනුවර නගරයේ ඔරලෝසු කණුව අසල සිට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත (පේරාදෙනිය පාර) ඔස්සේ මීටර් 800 ක් පමණ ගිය පසු පාරේ වම් පසින් අදාළ දේපල පිහිටා තිබේ.

මෙම දේපල, මීගහමුල්ල හේනේ ගෙදර අජිත් බණ්ඩාර සහ එදිරිසූරිය මුදියන්සේලාගේ දයානි පුෂ්ප කාන්ති එදිරිසූරිය යන අය ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2011 ක් වූ ඔක්තෝබර් මස 28 වැනි දින පෙ.ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.12.17 දින *රජයේ ගැසට් පත්‍රය* ද 2011.06.24 දින ද ඩේලි මිරර්, ලක්බිම තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :* නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී. අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011-2661815, 011-2661835.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ,
මහනුවර.
දුරකථන අංක : 071-4755974/071-8446374/077-7761706,
දුරකථන අංක./ෆැක්ස් : 081-2210595.

10-109

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කුරුඳුවත්ත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු ඉතා වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා සීමාවන් තුළ පිටකෝට්ටේ මිෂන් පටුමගේ පිහිටි දඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජී. බී. දොඩන්වල විසින් සාදන ලද 1991.03.18 වැනි දින අංක 700 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 2 නැමති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි පිටකෝට්ටේ මිෂන් පටුමග වරිපනම් අංක 33/1 දරන දේපල ඇතුළු අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 12.25.

මෙම දේපල මොරගොඩගේ පෝල් සාලිය පින්ටෝ සහ ෆිලොමිනා ඩැෆ්නි ද සිල්වා (හවුල්කරුවන් ඔටිනිප් එන්ටප්‍රයිසස්) යන අය ණයකරුවන් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.*- පිටකෝට්ටේ හන්දියේ සිට කෝට්ටේ පාරේ රාජගිරිය දෙසට මීටර් 800ක් පමණ පැමිණ වමට හැරී මිෂන් පාරට ඇතුලු වී තවත් මීටර් 300ක් පමණ ගමන් ගෙන නැවත වමට හැරී මිෂන් පටුමගට හැරෙන්න. පසුව මෙම පටුමගේ තවත් මීටර් 400 ක් පමණ ගිය විට වම් දෙසට හමු වන අඩි 12 ක මාර්ග ප්‍රවේශයට ඇතුළු වී අවසානය දක්වා ගිය විට අදාල දේපල පිහිටා තිබේ.

2011 ක් වූ ඔක්තෝබර් මස 27 වන දින ප.ව. 3.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.01.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2010.01.25 වැනි දින ද අයිලන්ඩ්, දිවයින හා 2010.02.02 වැනි දින තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුලතදී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :* නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011-2661815, 011-2661816.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 071-4755974/071-844374/077-7761706.
දුරකථන අංක /ෆැක්ස් : 081-2210595.

10-110

HNB 64 - 10

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මාතර ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2006.11.27 වැනි දින අංක 1688 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අජන්තා මල්කාන්ති විජේසේකර සහ කාංචන චෝදන විජේසේකර යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ නොවැම්බර් මස 04 වැනි දින පෙ.ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල.-* දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් සතරෙහි, මාතර මහ නගර සභා සීමාව තුළ මාතර කොටුවෙහි පිහිටි මිඩ්ල් ස්ට්‍රීට් හෙවත් මැද වීදිය, වරිපනම් අංක 06 දරන ඉඩමට බලයලත් මානක ටී. සී. ඩී. අභයගුණවර්ධන විසින් 1930.02.27 වැනි දින මැන සාදන ලද අංක 1940 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය රූඩ් 1 පර්චස් 0.3 වේ.

ඉහත විස්තර කරන ලද පිඹුර මැතක දී කරන ලද මැනුමකට අනුව දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් සතරෙහි මාතර මහ නගර සභා සීමාව තුළ මාතර කොටුවෙහි පිහිටි මිඩ්ල් ස්ට්‍රීට් හෙවත් මැද වීදිය, වරිපනම් අංක 06 දරන ඉඩමට බලයලත් මානක කේ. පී. එස්. යාපා විසින් 1989.06.26 වැනි දින මැන සාදන ලද අංක 8942 දරන පිඹුර ප්‍රකාර බෙදා ලොට් 1 ලෙස බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය රූඩ් 1 පර්චස් 0.3 වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.05.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2010.05.26 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* මාතර කොටුවට ඇති ප්‍රධාන දොරටුවෙන් කච්චේරි පාරේ මැද වීදියේ මීටර් 100 ක් ගමන් කොට මෙම දේපලට ළඟා විය හැකිය. එය මැද වීදියේ වරිපනම් අංක 06 දරන ස්ථානය වේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2 1/2%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. (දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441,
0714-424478.
ෆැක්ස් අංකය : 0114-617059.

10-147

---

HNB 60-10

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. රාජනාතන් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2007.05.04 දින අංක 1710 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම තේන්නහෙන්දිගේ සුගත් නන්දන ගුණසේකර සහ තඹවිට විදානගේ ජයංගනී පුෂ්පලතා යන අය ණයකරුවන් හැටියට සහ තේන්නහෙන්දිගේ සුගත් නන්දන ගුණසේකර උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින්

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ නොවැම්බර් මස 03 වැනි දින ප. ව. 3.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල.-* බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මොරටුව නගර සභා සීමාව තුළ කොරලවැල්ල පිහිටි වරිපනම් අංක 93/4 දරන මාදන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එල්. ආර්. එල්. පෙරේරා විසින් 1979.06.27 වැනි දින මැන සාදන ලද අංක 1270 දරන පිඹුර ප්‍රකාර ලොට් 5 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 18.25 වේ.

ඉහත කී අංක 1270 දරන පිඹුරේ ලොට් අංක 11 මතින් මාර්ග අයිතිය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.05.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2010.05.25 දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- මොරටුව නගර මධ්‍යයේ සිට පැරණි ගාලු පාරේ කි. මී. 1.25ක් පමණ ගොස් හමුවන පාලම ළඟින් ඇති විද්‍යාල මාවතට වමට හැරී මීටර් 200ක් ගොස් නැවත "නවහල්" පෙදෙසට වමට හැරී මීටර් 100ක් පමණ ගියවිට ඇප වශයෙන් තැබූ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2 1/2%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. (දුරකථන අංක 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,<br>
(මුළු දිවයිනටම සාම විනිසුරු),<br>
උසාවි කොමසාරිස්, තක්සේරුකරු<br>
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,<br>
උසාවිය පාර,<br>
කොළඹ 12.<br>
දුරකථන අංක : 0777-378441,<br>
0714-424478.<br>
ෆැක්ස් අංකය :0114-617059.

10-153

---

## හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - වත්තල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඔලුව විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2007.03.01 වැනි දින සහ අංක 1932 (පහත 1 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති) සහ 2007.11.29 වැනි දින සහ අංක 2232 (පහත දෙවැනි උපලේඛයේ සවිත්තරව විස්තර කර ඇති) දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම හිතකගේ දිනූෂා ශිවන්ති සිල්වා සහ සේනාධීරගේ විපුල් කුමාර ලලිත් සිල්වා යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල්, අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ නොවැම්බර් මස 02 වැනි දින පිළිවෙලින් ප.ව. 2.30 ට සහ ප.ව. 3.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය 1* : බස්නාහිර පළාතේ, (නමුත් කොළඹ කොට්ඨාසය ඇතුළත ලියාපදිංචි කරන ලද) ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභාවේ හැඳල උප කාර්යාලය තුළ හැඳල හේකිත්තෙහි පිහිටි හේකිත්ත පාර වරිපනම් අංක 54/5 දරන කැටෙයිවත්ත සහ හෝමදිරියාගහවත්ත හෙවත් ගොඩකදුරුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් මැන සාදන ලද 1993.11.05 වැනි දිනැති අංක 3267 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ 2 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි සහ සියලු දේත් වේ. විශාලත්වය පර්චස් එකොළහයි දශම තුනයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 11.30).

*උපලේඛනය 2.*- බස්නාහිර පළාතේ, (නමුත් කොළඹ කොට්ඨාසය ඇතුළත ලියාපදිංචි කරන ලද) ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභාවේ හැඳල උප කාර්යාලය තුළ හැඳල හේකිත්තෙහි පිහිටි හේකිත්ත පාර වරිපනම් අංක 89, 89ඒ, 89බී සහ 89සී දරන මාදන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. පී. ඩී. ඩබ්. නානායක්කාර විසින් මැන සාදන ලද 1999.06.18 වැනි දිනැති අංක 23/99 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 2 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි සහ සියලු දේත් වේ. විශාලත්වය පර්චස් නවයයි දශම දෙකයි හයක් (අ. 0, රූඩ් 0, පර්. 9.26).

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.09.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.09.13 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- 1 කොළඹ මීගමුපාරේ ගාල්ල හන්දිය දක්වා ගොස්, එතැනින් වමට හැරී, වත්තල හේකිත්ත පාර, යාර 450 ක් පමණ ගමන් කරන්න. වැලි අමුන මංසන්දිය ආසන්නයේ දේපල පිහිටා ඇත.

*ඉඩමට පිවිසීම 11.*- කොළඹ මීගමු පාරේ, ගාල්ල හන්දිය දක්වා ගොස්, එතැනින් වමට හැරී වත්තල හේකිත්ත පාරේ කිලෝමීටරයක් පමණ ගමන් කරන්න. අදාළ දේපළ රෝමානු කතෝලික දේවස්ථානය සහ ජැන්ස් දේවගැති මාවතට ඉඩම් කට්ටි දෙකක් මෙපිටින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපිල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට

දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. (දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441,
0714-424478.
ෆැක්ස් අංක : 0112 - 345975

10-149

---

## හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. - තලංගම ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2004.08.23 වැනි දින සහ 2006.07.12 වැනි දින සහ පිළිවෙලින් අංක 2423 සහ 3109 (මෙහි පහත 1 වැනි උපලේඛනයේ විස්තර කර ඇති) සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2009.03.13 දිනැති සහ අංක 4884 (මෙහි පහත 2 වැනි උපලේඛනයේ විස්තර කර ඇති) දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මඩ පෝරුගේ විජේසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ නොවැම්බර් මස 02 වැනි දින පිළිවෙලින් පෙ.ව. 9.30 ට සහ පෙ.ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානවල දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය 1* : බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුළ තලවතුගොඩ ගොඩැල්ලේලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද 1994.05.29 වැනි දින සහ අංක 6554 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 7 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් දහඅටයි දශම දෙකක් (අ.0, රූ.0, පර්. 18.2).

අංක 2423 සහ 3109 දරන උකස් බැඳුම්කරයන් හි දෙවැනි උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

*උපලේඛනය II* .- බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ මාලපල්ල ගමේ පිහිටි නැගෙනහිර ගලබොඩවත්ත නොහොත් ගලවිලලන්ද ගලබොඩවත්ත සහ ගලවිල එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් මැන සාදන ලද 1972.12.10 සහ 1973.05.22 වැනි දින සහ අංක 1195 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 41 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් විස්සයි දශම දෙකයි පහක් (අ.0, රූ.0, පර්. 20.25).

ඉහත කී ඉඩම් කොටස නැවත මැනීමකට අනුව, ඉහත කී මාලපල්ල ගමේ වටරවුම් පාරේ වරිපනම් අංක 71/16 හි ගලවිලලන්ද ගලබොඩවත්ත සහ ගලවිල එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ඒ. සිරිසේන විසින් මැන සාදන ලද 2008.12.12 දිනැති අංක 1619 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් විස්සයි දශම දෙකයි පහක් (අ. 0 රූ. 0 පර්. 20.25).

එකී අංක 1195 දරන උකස් බැඳුම්කරයේ ලොට් ආර් 1, ආර් 2, ආර්. 3, ආර් 7 සහ ආර් 6 හි මාර්ග අයිතිය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.09.13 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම 1* .- තලවතුගොඩ සිට හෝකන්දර පාරේ. කි. මී. 0.85 ක් (හෝකන්දර හන්දිය ළඟාවීමට කිලෝ මීටර් 1.5 ක් මෙපිටින්) ශ්‍රී නන්ද ජෝතිකාරාම පාරට දකුණට හැරී (තාර/ගුරු ප්‍රසිද්ධ මාර්ගයට) කිලෝ මීටරයක පමණ දුරක් ගමන් කොට අවසාන වශයෙන් (මහජන සායනය/වෛද්‍ය මධ්‍යස්ථානයට යාබද) අඩි 10-15 පළල ගුරු පාරට දකුණට හැරී, මීටර් 30ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ වම් අත පැත්තේ පිහිටා ඇත. මෙය ශ්‍රී නන්ද ජෝතිකාරාම පාරේ 318/ඒ පරිශ්‍රය වශයෙන් හැඳින්වේ.

*ඉඩමට පිවිසීම 2*.- කොට්ටාවේ සිට අතුරුගිරිය පාරේ, රුක්මලේ ප්‍රධාන බස්නැවතුම් පළ දක්වා කිලෝ මීටර් 3ක් පමණ දුරක් ගමන් කොට අඩි 30ක් පමණ තාර දමා ඇති පාරට දකුණට හැරී (රුක්මල්ගම නිවාස යෝජනා ක්‍රමයට දිවෙන ප්‍රධාන මාර්ගය) බුදු පිළිමය දක්වා මීටර් 75ක් පමණ ගමන් කර, එම තාර පාරේ ම දකුණු පැත්තට නැවත හැරී මීටර් 25ක් පමණ ගමන් කොට නැවත වම් අත පැත්තේ ඇති පාරට හැරී මීටර් 50ක් පමණ දුරක් ගොස්, වමට හැරී මීටර් 150ක් පමණ දුරක් ගොස් ගලබොඩවත්ත පාරට අවසාන වශයෙන් දකුණට හැරී (ගලබොඩවත්ත රවුම්පාර) මීටර් 75ක් පමණ දුරක් ගියවිට වම් අත පැත්තේ අදාළ දේපළට ළඟවිය හැකිය. මෙම දේපළ හෝමාගම ගලබොඩවත්තේ රවුම් පාරේ අංක 34/17/1 වශයෙන් හැඳින්වේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු සහ හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10 (දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441,
0714-424478.
ෆැක්ස් අංක : 0112 - 345975.

10-148

---

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - කරන්දෙනිය ශාඛාව

(කලින් රුහුණ සංවර්ධන බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2011.11.04 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### *උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය*

දකුණු පළතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, කරන්දෙනිය දකුණු මාගලට අයත්, දේනගොඩ පිහිටි දේනගොඩවත්ත හෙවත්, කැකිරියෙ කන්ද අද්දර හැට ඉඩමේ බලයලත් මානක සී. ද එස්. ගිනිගේ මහතා විසින් 1965 මැයි මස සහතික කරන ලද අංක 3568 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ අංක 21 දරන රූඩ් තුනයි පර්චස් තිස් හතයි දශම පහක් (අක්. 0, රූඩ් 03, පර්. 37.5) විශාල ඉඩමේ මුළු වසන් බිම සහ ඊට අයත් රබර් වගාව ද ඇතුළු සියලු ගහකොළ, පළතුරු වේ.

වැඩි විස්තර සඳහා 2010.02.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2010.05.21 දින දිනමිණ, තිනකරන් හා ද අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- අම්බලන්ගොඩ සිට ඇල්පිටිය පාරේ කි. මී. 08ක් පමණ ගිය විට මහ ඒදණ්ඩ හන්දිය හමුවේ. එතැන් සිට ඌරගහට යන පාරේ කි. මී. 05ක් පමණ ගිය විට කැකිරිස් කන්ද හන්දියේ මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත, මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ, දරන ස්ථානයේ පිහිටි ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ, දකුණු පළාත් කාර්යාලයේ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරිතුමාට ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041 - 2231532, 2226208, 2226209, 09-2290135.

ජී. පී. ආනන්ද,
සාම විනිසුරු බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත, වල්ගම,
මාතර.
දුරකථන අංකය 041- 2228731/071-4438516.

10-185

---

## සම්පත් බැංකුව පීඑල්සී

( සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩබ්ලිව් පී. ජී. චින්තක
ගිණුම් අංක : 1068 5330 6450

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009 මැයි 14 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 954 ප්‍රකාර රුපියල් පන්ලක්ෂ පනස් අටදහස් පන්සිය හතයි ශත අනූනමයක (රු. 558,507.99) මුදලක් 2009 ජනවාරි 29 වැනි දින සිට බැඳුම්කර අංක 954 මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂ දාහදහස් එකසිය තිහයි ශත විසිඅටක

(රු. 510,130.28) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.09.11 දින *රජයේ ගැසට් පත්‍රයේ,* 2009.09.01 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2011.10.27 දින ප. ව. 1.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ රයිගම් පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (ගලහිටියාව ඒකකය) බුළුගහගොඩ ග්‍රාමයේ පිහිටි කඳාන පාර වරිපනම් අංක 375/11 දරන " දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. චන්ද්‍රතිලක යන අය විසින් සාදන ලද 1999 පෙබරවාරි මස 22 දාතම හා අංක 2057 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඊ. ඩී. විලියම්ගේ ඉඩම නැගෙනහිරට : ඩී. යූ. ආර්. අපොන්සුගේ ඉඩම දකුණට : ලොට් 1 බී (පාර) සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම අටයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 9.80) විශාල ඉඩම් කොටස සමග පස ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයක් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 2057 අනුව වෙලුම/පත්ඉරුව බී 659/65 හි ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එස්. ඩී. චන්ද්‍රතිලක යන අය විසින් සාදන ලද 1999 ජනවාරි මස 02 දාතම හා අංක 2057 පිඹුරේ හි ලොට් 1 බී බලයලත් මානක තැන එස්. බී. ජයසේකර යන අය විසින් සාදන ලද 1987 මාර්තු මස 20 දාතම හා අංක 2011 පිඹුරේ හි ලොට් 6 මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-190

---

### කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී - හෝමාගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී, (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක ජී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් 2002 අගෝස්තු මස 30 වැනි දින සාදන ලද අංක 2787 දරන පිඹුරේ දැක්වෙන බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ පල්ලේපත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැදිගමුව වැලිපිල්ලෑවේ ඕවිට කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 3 දරන පර්චස් විසිහතරයි දශම හයයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 24.60) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වගාවන් සහ අනෙකුත් සියලු දේත් සමග වේ.

කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැදිගමුව පිහිටි වැලිපිල්ලෑවේ ඕවිට කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 4 දරන පර්චස් විස්සයි (අ. 0, රූ. 0, පර්. 20) යන එහි පිහිටි ගොඩනැගිලි වගාවන් සහ අනෙකුත් සියලු දේත් සමග වේ.

මන්දාකිණී හෝල්ඩින්ස් යන නාමය සහ විලාශයෙන් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන රන්දීර් මංජුල විතාන ණයකරු හැටියට ද, කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2011 ක්වූ ඔක්තෝබර් මස 28 වැනි දින පෙ. ව. 11.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.07.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2010.07.12 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2011.10.07 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2011.10.07 වැනි දින ලක්බිම සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - ගොඩගම හංදියේ සිට අතුරුගිරිය පාරේ කි. මී. 2.5ක් පමණ ගොස් පනාගොඩ හංදියෙන් දකුණට හැරී අඹුල්ගම පාරේ. කි. මී. 2.3ක් ගිය විට වැලිපිල්ලෑව හංදියෙන් දකුණට හැරුණු විට නවන්දමුල්ල පාරේ දකුණු අත පැත්තේ දෙවැනි කොටසේ අදළ ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ හෝමාගම ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 99, උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී.
අංක 100, හයිලෙවල් පාර, හෝමාගම.
දුරකථන අංක : 2895128 - 9
ෆැක්ස් අංකය : 2748114.

10-151

### සෙලාන් බැංකුව පීඑල්සී - ඇඹිලිපිටිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ දෙදෙනාම ඇඹිලිපිටිය පදිංචි කොටකෙතන කංකානමලාගේ ජයන්ත නිල්මිණි ජයවීර සහ වික්‍රමසිංහගේ සුනිල් ජයවීර යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

#### 1 වැනි වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ ඇඹිලිපිටිය පල්ලේගම ගමේ පිහිටි එෆ්වීපී 779 හි අංක 17 දරන අතිරේක සැලැස්මේ ලොට් 2284 ලෙස නිරූපනය වන සහ 2000.03.20 දිනැති අංක ර/උව/ඇ/ප්‍ර/742 (ගොඩ) දරන ජයභූමි ප්‍රදානයේ සඳහන් ලොට් 2284 (ගොඩබිම) ලෙස හඳුන්වනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස රූඩ් එකයි පර්චස් තිස්තුනයි දශම පහයි හතරක් (අ. 0 රූ. 1 පර්. 33.54) ක් නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි අටයි හයක් (හෙක්ටයාර් 0.186) ක් විශාල ගොඩනැගිලි, වගා, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ජයභූමි ඉ.සං/13/1294 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2011 නොවැම්බර් මස 02 වැනිදින පස්වරු 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියයේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* ඇඹිලිපිටිය ඔරලෝසු කණුව මංසන්ධියේ සිට රත්නපුර දෙසට දිවෙන මාර්ගයේ මීටර් 100ක් පමණ ගිය විට දකුණු පසට ඇති මොරකැටිය මාර්ගයට හැරී තවත් කි. මී. 4.5ක් පමණ ගිය විට මාර්ගයේ දකුණු පස "ජයවීර හාඩ්වෙයාර්" නමින් අදාළ දේපළ පිහිටා ඇත.

#### 2 වැනි වෙන්දේසියේ විකිණීම

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය උඩගම පිහිටි බලයලත් මිනින්දෝරු ජී. ඩබ්ලිව්. කේ. මනම්පේරි විසින් සාදන ලද 2003.06.25 දිනැති අංක 1963 සැලැස්මේ නිරූපනය වන සහ ජාලත්ගේ පංගුව, ජාහිංගේ පංගුව සහ ජාගොඩගේ පංගුව නමැති ඉඩමෙන් ලොට් 1 ලෙස නිරූපනය වන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස අක්කර එකයි රූඩ් එකයි පර්චස් තිස්හතයි දශම දෙකක් (අ. 1 රූ. 01 පර්. 37.2) ක් නොහොත් හෙක්ටයාර් 0.600ක් විශාල, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ජී 219/115 යටතේ ලියාපදිංචි කර ඇත.

2. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න කෝරළේ දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය උඩගම පිහිටි බලයලත් මිනින්දෝරු ජී. ඩබ්ලිව්. කේ. මනම්පේරි විසින් සාදන ලද 2003.06.25 දිනැති අංක 1964 සැලැස්මේ නිරූපනය වන සහ ජාලත්ගේ පංගුව, ජාහිංගේ පංගුව සහ ජාගොඩගේ පංගුව නමැති ඉඩමෙන් ලොට් 1 ලෙස නිරූපනය වන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දහතුනක් (අ. 1 රූ. 02 පර්. 13)ක් නොහොත් හෙක්ටයාර් 0.640ක් විශාල ගොඩනැගිලි වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ජී 219/116 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් පහත සඳහන් ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටස් වේ.

පෙර කී උඩගම පිහිටි ජාලත්ගේ පංගුව, ජාහිංගේ පංගුව සහ ජාගොඩගේ පංගුව නමැති ඉඩම් කොටස අක්කර හයසීයක් (අ. 600 රූ. 0 පර්. 0)ක් විශාල ඉඩම කාණ්ඩය/පත්‍රිරුව පී 30/197 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2011 නොවැම්බර් මස 02 වැනි දින පස්වරු 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - ඇඹිලිපිටිය ඔරලෝසු කණුව මංසන්ධියේ සිට රත්නපුර දෙසට දිවෙන මාර්ගයේ කි. මී. 1ක් පමණ ඉදිරියට ගිය විට ඇති උඩගම මංසන්ධිය ද පසුකර එම මාර්ගයේ ම තවත් කි. මී. 1.5ක් පමණ ඉදිරියට ගිය විට මාර්ගයේ දකුණු පසට වන්නට පැරණි ඇඹිලිපිටිය මාර්ගය හමු වේ. එම මාර්ගයේ තවත් මීටර් 250ක් පමණ ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පස පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - *රජයේ ගැසට් පත්‍රයේ* 2011.03.06 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2011.05.07 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2011.05.23 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-2456458, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011- 2572940.

10-122

**සෙලාන් බැංකුව පීඑල්සී - කොච්චිකඩේ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ දෙදෙනාම කොච්චිකඩේ පදිංචි වර්ණකුලසූරිය රෝයි තිසේරා සහ කිරිවත්තුඩුවගේ සුසන්ති ශිරෝමනී අප්පුහාමිනේ යන අය බන්ධනදායින් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

1 වැනි වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාව තුළ නයිනමඩම කම්මල් පත්තුව උපකාර්යාල ප්‍රදේශය තුළ තඹරවිල පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1995.01.20 වැනි දිනැති අංක 644ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන "තෙක්කගහවත්ත සහ වෙළලගෙ කහටගහ වතු පංගුව" නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද පර්චස් තිස්හයයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 36.9) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව පී 40/241 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2011 නොවැම්බර් මස 08 වැනි දින පෙරවරු 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*.- කොළඹ - හලාවත ප්‍රධාන මාර්ගයේ පිහිටි කොච්චිකඩේ මංසන්ධියේ සිට වෙන්නප්පුව දෙසට යන විට ඇති තොප්පුව මංසන්ධියෙන් දකුණු පසට ඇති දංකොටුව දෙසට දිවෙන මාර්ගයට හැරී ඉදිරියට ගිය විට (කි. මී. 1.25 ක් පමණ) මාර්ගයේ දකුණු පස අදාල දේපල මාඔයට යාබදව පිහිටා ඇත.

2 වැනි වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාව තුළ නයිනමඩම කම්මල් පත්තුව උප කාර්යාල ප්‍රදේශය තුල තඹරවිල පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ගුණතිලක විසින් සාදන ලද 1999.07.10 වැනි දිනැති අංක 99/107 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අඹගහවත්ත, කොන්ගහවත්ත සහ කැටකැලගහවත්ත නැමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස රූඩ් එකයි පර්චස් දොළහයි දශම පහක් (අ.0, රූ. 1, පර්. 12.5) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව පී 124/139 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2011 නොවැම්බර් මස 08 වැනි දින පස්වරු 11.45 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*.- කොළඹ - හලාවත ප්‍රධාන මාර්ගයේ පිහිටි කොච්චිකඩේ මංසන්ධියේ සිට වෙන්නප්පුව දෙසට යන විට ඇති තොප්පුව මංසන්ධියෙන් දකුණු පසට ඇති දංකොටුව දෙසට යන මාර්ගයට හැරී තවත් කි. මී. 1.25 ක් පමණ ඉදිරියට ගොස් නැවතත් වම්පසට ඇති තඹරවිල මාර්ගයට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 125 ක් පමණ ගිය විට අදාල දේපළ මාර්ගයේ වම්පස පිහිටා ඇත.

*3 වැනි වෙන්දේසියේ විකිණීම*

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළයේ කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාව තුළ නයිනමඩම කම්මල් පත්තුව උප කාර්යාල ප්‍රදේශය තුළ තඹරවිල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එම්. දසනායක විසින් සාදන ලද 1997.03.02 වැනි දිනැති අංක 4445 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහමුල ඕවිට නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ගොඩනැගිලි, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ජී 62/149 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2011 නොවැම්බර් මස 08 වැනි දින පෙරවරු 11.15 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*.- කොළඹ - හලාවත ප්‍රධාන මාර්ගයේ පිහිටි කොච්චිකඩේ මංසන්ධියේ සිට වෙන්නප්පුව දෙසට යන විට ඇති තොප්පුව මංසන්ධියෙන් දකුණු පසට ඇති දංකොටුව දෙසට යන මාර්ගයට හැරී කි. මී. 1.25 ක් පමණ ඉදිරියට මාර්ගයේ දකුණු පස අදාළ දේපළ මා ඔයට යාබදව පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- *රජයේ ගැසට් පත්‍රයේ* 2011.03.25 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2011.03.21 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2011.03.17 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.-සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. 1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකල යුතු ය. හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමණාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර කොළඹ 03.

දුරකථන අංක :011-2456458, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940

10-121

### මහජන බැංකුව -බොරැල්ල ශාඛාව

1986 අංක 32 දරණ පනතේ සංශෝධිත 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

1 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් අලුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ පරණ නුවර පාරේ පැලියගොඩ ගමෙහි ගංතෙරවත්ත නමැති ඉඩමෙන් මැන බෙදාවෙන්කර ඇති "ඒ" අක්ෂරය දරණ ඉඩම් කැබැල්ලට එන්. ඩී. සිරිසේන අවසරලත් මානක තැනගේ අංක 201 සහ 1965.01.04 දින දරණ පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් විසිතුනයි දශම දෙකයි බිංදුවයි (අ. 0 රූ. 0 පර්චස් 23.20) විශාල ඉඩම සහ ඊට අයත් සියලුම දේ ද සමග වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2011ක්වූ ඔක්තෝබර් මස 30 වැනි දින පෙ. ව .11.30ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2009.12.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2009.11.23 දින දිණමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත්වල පලකර ඇති වෙන්දේසි යෝජනාවන් සඳහා අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.-* කොළඹ සිට නුවර පාරේ කැළණි පාලම පසු කළ විට හමුවන නුවර පාර හා මීගමු පාර එක්වන හන්දියේ සිට මීගමු පාර දෙසට මීටර් 100ක් පමණ දුරින් ඇති පරාක්‍රම මාවතේ මීටර් 200 පමණ දුරින් පරණ නුවර පාරේ වම්පසට මායිම්ව අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැණුම් මිලෙන් 10%ක්ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
05. විකුණුම් වියදම් සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක්වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ 1, අංක 11, ආධිපාද වීදියේ, මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතු ය. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කළ මුදල් දින තිහක් ඇතුලත නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සමාදාන විනිශ්චයකාර.
(මුළු දිවයිනටම)

*කාර්යාලය :* අංක 25බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 011- 5756356, 071 - 8760986.

*නිවස* : 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංකය : 011 2419126.

10 - 134

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | **පිටපතක මිළ** රු. ශ. | **තැපැල් ගාස්තුව** රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. *ඊළඟ ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2011** | | | |
| ඔක්තෝබර් | 2011.10.07 | සිකුරාදා | 2011.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.14 | සිකුරාදා | 2011.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.21 | සිකුරාදා | 2011.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.28 | සිකුරාදා | 2011.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2011.11.04 | සිකුරාදා | 2011.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.11.11 | සිකුරාදා | 2011.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.11.18 | සිකුරාදා | 2011.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.11.25 | සිකුරාදා | 2011.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2011.12.02 | සිකුරාදා | 2011.11.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.12.09 | සිකුරාදා | 2011.11.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.12.16 | සිකුරාදා | 2011.12.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.12.23 | සිකුරාදා | 2011.12.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.12.30 | සිකුරාදා | 2011.12.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.